# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல — 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1387 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 27/08/2024
පැය 1405

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.**

2024.08.26 වන දින රාත්‍රී කාලයේ මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෝදර ප්‍රදේශයේදී ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 මිලිග්‍රෑම් 100ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මෝදර, කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීරිගම පොලිස් ස්ථානය.**

2024.08.26 වන දින දහවල් කාලයේ මීරිගම පොලිස් වසමේ කටුවාකැලේ ප්‍රදේශයේදී මීරිගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 2160 ක් (බැරල් 12) ක් **සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන මාවීහේන, මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීරිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන්, විදේශීය දුම්වැටි, ඇතුළු තවත් දේපල සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකය.**

2024.08.26 වන දින උදෑසන කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර මෙරටට තීරුබදු රහිතව රැගෙන එන ලද **විදේශීය මත්පැන් බෝතල් 47 ක්, විදේශීය දුම්වැටි පැකට් 06, විදේශීය දුම්වැටි කාටුන් 11 ක්, කෝපි පැකට් 2304 ක්, ශල්‍යකර්ම උපාංග, රූපලාවන්‍ය ආලේපන හා මොටර් රථ වාහන අමතර කොටස් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන හා සැකකාරිය වයස අවුරුදු 61 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.**

2024.08.27 වන අද දින අළුයම් කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ඩුබායි රාජ්‍යයේ සිට මෙරටට තීරුබදු රහිතව රැගෙන එන ලද **විදේශී දුම්වැටි 14800 (කාටුන් 74)ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන මඩාටුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පන්සියගම පොලිස් ස්ථානය.**

2024.08.27 වන දින උදෑසන කාලයේදී පන්සියගම පොලිස් වසමේ මකුල්පොත ප්‍රදේශයේදී පන්සියගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන මකුල්පොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පන්සියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**